**#mediaethicsSL#lka#SinhalaPress#SundayDivaina#December22**

වාර්තාකරණයේ නිරවද්‍යතාවය යනු පුවත්පතක මූලිකම වගකීමක් මෙන්ම ආරක්ෂා කළ යුතු මූලික මාධ්‍ය සදාචාරාත්මක ප්‍රතිපත්තියක්ද වේ. නිසි මූලාශ්‍රයන් භාවිතා කිරීමේ අවශ්‍යතාවය, පුවතකට අදාළ කරුණු සම්බන්ධයෙන් මැනවින් සොයා බැලීමේ අවශ්‍යතාවය ආදී සියල්ල පැමිණෙන්නේද එම නිරවද්‍යතාවය යන අවශ්‍යතාවය සමගිනි. කෙසේ නමුත් කණගාටුවට කරුණ වන්නේ, ඇතැම් පුවත්පත් මගින් ඒ සම්බන්ධයෙන් දක්වන අවධානය අතිශයින්ම අවම මට්ටමක තිබීමයි.

2017 වසරේ දෙසැම්බර් 24 දින දිවයින පුවත්පතේ පළවූ කතුවැකියෙන් එක්සත් ජාතීන්ගේ නියෝජිත පිරිසකගේ ආගමනය සහ ඔවුන්ගේ ක්‍රියාකලාපය සම්බන්ධයෙන් විස්තර පළ කොට තිබිණි. මෙහිදී "එක්සත් ජාතීන්ගේ නියෝජිත පිරිස අතර සිටි එක්සත් ජාතීන්ගේ විශේෂ නියෝජිත බෙන් එමර්සන්, ඩී.කේ.පී.දසනායක සිරගත වීම ගැන සතුට ප්‍රකාශ කර තිබිණි" යනුවෙන් වූ සඳහනක්ද දක්නට ලැබිණි. කෙසේ නමුත් මෙම කතුවැකියෙන් සඳහන් කරනා ශ්‍රී ලංකාවට පැමිණි විශේෂ නියෝජිත පිරිසට බෙන් එමර්සන් කෙනෙකු ඇතුළත් නොවිණි!

මෙහිදී සිදුව ඇත්තේ ප්‍රමාණවත් ලෙසින් කරුණු සොයා නොබැලීම නිසාවෙන් වූ දෝෂයක් හෝ සිතාමතාම සාවද්‍ය තොරතුරු ප්‍රකාශයට පත් කිරීමක් විය හැක. ඒ කුමක් වුවත් තමන් ඉදිරිපත් කරනා තොරතුරු නිරවද්‍ය වීම සම්බන්ධයෙන් පුවත්පතකට බරපතළ වගකීමක් තිබේ. දිවයින පුවත්පත මගින් උල්ලංඝනය කොට ඇත්තේ එයයි